සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

8665

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 08 | |
| විෂයය / பாடம் / Subject | විද්‍යාව | |
| පත්‍රය / வினாத்தாள் / Paper | I ,II | |
| කාලය / காலம் / Time | පැය 02යි. | |

නම:-........................................ විභාග අංකය:-........................................

සැලකිය යුතුයි.


- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- II කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු ලියන්න.

## I කොටස

01. හරිත ශාක ප්‍රභාසංශ්ලේෂණයේ දී යොදා ගන්නා අභ්‍යන්තර සාධකය වන්නේ,

1. හිරුඑළිය  2. ජලය
3. කාබන්ඩයොක්සයිඩ්  4. හරිතප්‍රද

02. රූපයේ දැක්වෙන ජීවියා අයත් වන කොරළ සහිත වියළි සමක් ඇති, සමෙහි ග්‍රන්ථි නොපිහිටන සත්ව කාණ්ඩය කුමක් ද?



1. රෙප්ටීලියා
2. ඇම්ෆීබියා
3. පිස්කේස්
4. ආත්‍රොපෝඩා

03. භූගත කඳක් මගින් සිදු කරන කාර්යයක් නොවන්නේ,

1. ආහාර සංචිත කිරීම  2. කාලතරණය
3. ප්‍රභාසංශ්ලේෂණය  4. වර්ධක ප්‍රචාරණය

04. වායුගෝලයේ ආර්ද්‍රතාවය වැඩි අවස්ථාවේ ශාක පත්‍රවලින් ජලය වැස්සීම හැඳින්වෙන්නේ,

1. උත්ස්වේදනය ලෙස ය.  2. බින්දුදය ලෙස ය.
3. ස්කන්ධ ප්‍රවාහනය ලෙස ය.  4. විසරණය ලෙස ය.

05. ප්‍රතිරෝධය මනිනු ලබන ඒකක කුමක් ද?

1. වෝල්ට් ය.  2. ඇම්පියර් ය.
3. වොට් ය.  4. ඕම් ය.

EXAMRESULTS.LK

06. පදාර්ථය සතු භෞතික ගුණය හා එය යෙදා ගන්නා අවස්ථාව නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

1. දෘඪතාව - වැලි කඩදාසි සෑදීම
2. භංගුරතාව - රබර් බැලුන සෑදීම.
3. දුඩිබව - වීදුරු කැපීම
4. ප්‍රත්‍යස්ථතාව - මැටි භාණ්ඩ සෑදීම.

07. දහනයේ දී දීප්තිමත් දැල්ලක් සහිත ව දුවී සුදු කුඩක් ඉතිරි කරන රසායනික ද්‍රව්‍යය වනුයේ,

1. සෝඩියම් ය.
2. සල්ෆර් ය.
3. ඇලුමිනියම් ය.
4. මැග්නීසියම් ය.

08. මිනිස් සිරුරේ ඇති බාහිස්‍රාවීය අවයව අයත් වරණය කුමක් ද?

1. ඇස, සම, වකුගඩු
2. සම, පෙනහළු, වකුගඩු
3. පෙනහළු, ඇස, මුඛය
4. මුඛය, නාසය, ඇස

09. පහත සඳහන් ජීවී ලක්ෂණ සලකා බලන්න.

a. දේහය ඛණ්ඩවලට බෙදී ඇත.

b. ද්වි පාර්ශ්වික සමමිතිය දක්වයි.

a. සිහින් දිග පණු ආකාර දේහ දරයි.

මෙම ලක්ෂණ අයත් සත්ත්ව කාණ්ඩය වන්නේ,

1. නිඩාරියා
2. මොලුස්කා
3. ආත්‍රොපෝඩා
4. ඇනෙලිඩා

10. ක්ෂුද්‍ර ජීවීන් ආහාරය මත ක්‍රියාත්මක වීම නිසා ආහාරයට ඇති වන බලපෑම වනුයේ,

1. ආහාරයේ වයනය වෙනස් වීම.
2. ආහාරයේ රස වෙනස් වීම.
3. ආහාරයේ ගන්ධය වෙනස් වීම.
4. ආහාරයේ වර්ණය, වයනය, ගන්ධය හා රසය වෙනස් වීම.


11. සාන්ද්‍රීකරණය මගින් කල්තබා ගත හැකි ආහාරයක් වනුයේ,

1. කිරි
2. පලතුරු
3. කොස් ඇට
4. මිරිස්

12. සන්නායකයක ප්‍රතිරෝධය කෙරෙහි බල නොපාන සාධකය වන්නේ,

1. පාෂ්ඨයේ ස්වභාවය ය.
2. සන්නායකය සෑදී ඇති ද්‍රව්‍ය යි.
3. සන්නායකයේ දිග ය.
4. සන්නායකයේ හරස්කඩ වර්ගඵලය ය.

13. බල්බය සම්බන්ධ මිනුම් ලබා ගැනීම සඳහා a හා b ස්ථානවලට පිළිවෙළින් සම්බන්ධ කළ යුත්තේ,




1. වොල්ට්මීටරය, ඇමීටරය
2. ඇමීටරය, වොල්ට්මීටරය
3. ඇමීටරය, ගැල්වනෝමීටරය
4. වෝල්ට්මීටරය, ගැල්වනෝමීටරය


14. රසායනික විපර්යාසයක් වන්නේ,

1. කොපර් සල්ෆේට් ජලයේ දිය කිරීම
2. ඉටි රත් කිරීම
3. සෝඩියම් කැබැල්ලක් ජලයට දැමීම
4. කඩදාසිය කැබැලිවලට වෙන් කිරීම

15. මධ්‍ය ස්නායු පද්ධතියේ පහත සඳහන් කොටස්වලින් ඉටු කෙරෙන කාර්යය නිවැරදිව දක්වා ඇති පිළිතුරු තෝරන්න.

1. මස්තිෂ්කය - හෘද ස්පන්දනය වේගය පාලන කරයි.
2. අනුමස්තිෂ්කය - දේහයේ සමතුලිතාව පාලනය කරයි.
3. සුෂුම්නා ශීර්ෂකය - ඉච්ඡානුක ක්‍රියා පාලනය කරයි.
4. සුෂුම්නාව - උසස් මානසික ක්‍රියා පාලනය කරයි.

16.




මල බැඳීමට අවශ්‍ය සාධක විමසා බැලීමේ ක්‍රියාකාරකමක් රූපයේ දක්වේ. මෙහිදී ලැබෙන නිරීක්ෂණයක් වන්නේ පහත කවරක් ද?

1. A නළයේ යකඩ ඇණ මළ බැඳී නැත.
2. B නළයේ යකඩ ඇණ මළ බැඳී නැත.
3. C නළයේ යකඩ අණ මළ බැඳී නැත.
4. A සහ C නළවල යකඩ ඇණ මළ බැඳී ඇත.

17. රාත්‍රී අහසේ නැගෙනහිර සිට බටහිර දිශාවට චලනය නොවන සේ පෙනෙන තාරකාව වනුයේ,

1. පෝලාරිස් ය.
2. සීරියස් ය.
3. පොලක්ස් ය.
4. රෙගියුලස් ය.

18. ජීවන චක්‍රයක් පිළිබඳ අධ්‍යනය වැදගත් වන්නේ,

1. පලිබෝධ මර්දනය සඳහා ය.
2. රෝග වාහකයින් මර්දනය සඳහා ය.
3. ජෛව විවිධත්වය සංරක්ෂණය සඳහා ය.
4. ඉහත සියලුම කරුණු සඳහා ය.

19. අකුණු කාලගුණයක් පවතින අවස්ථාවක දී නො කළ යුතු වන්නේ,

1. නිවසෙහි විදුලිය විසන්ධි කිරීම.
2. හුදෙකලා උස් වෘක්ෂ අසල හෝ උස්බිම්වලින් ඉවත්වීම.
3. පාපැදි, යතුරු පැදි, ට්‍රැක්ටර් වැනි වාහන පැදවීම.
4. ජලාශවල පිහිනීමෙන් හා ඔරු පැදීමෙන් වැළකීම.

20. මානසික සුවයක් ලබා දීමට සංගීතය යොදා ගෙන සිදු කරනු ලබන ප්‍රතිකාර ක්‍රමය හැඳින්වෙන්නේ,


1. කටු චිකිත්සාව ලෙස ය.
2. සංගීත චිකිත්සාව ලෙස ය.
3. ස්නායු චිකිත්සාව ලෙස ය.
4. අක්ෂි චිකිත්සාව ලෙස ය.

(ලකුණු 20 X 2 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) (A) වෙළඳපොළෙන් මිල දී ගත් ආහාර වර්ග කිහිපයක් පහත දැක්වේ.




(i) මාළු සහ මිරිස් යන ද්‍රව්‍ය පරිරක්ෂණයට යොදා ගන්නා සම්ප්‍රදායික ක්‍රමය ලියන්න. (ලකුණු 1)

(ii) අඹ වැනි පළතුරක් යොදා ගෙන ඔබට විද්‍යාගාරයේ දී සකස් කළ හැකි නිෂ්පාදිතය කුමක් ද? (ලකුණු 1)

(iii) එහි දී යොදා ගත් පරිරක්ෂකය කුමක් ද? (ලකුණු 1)

(iv) ආහාර පරිරක්ෂණයේ ඇති වාසි 2ක් ලියන්න. (ලකුණු 2)

(v) ස්වයං වියෝජනය යනු කුමක් ද? (ලකුණු 1)

(vi) ආහාර ඇසුරුම් ලේබලයක අඩංගු විය යුතු වැදගත් කරුණු 4ක් ලියන්න. (ලකුණු 2)


(vii) පිරිසැකසුම් ආහාරයකට උදාහරණ 2ක් ලියන්න. (ලකුණු 2)

(B) පදාර්ථයේ භෞතික අවස්ථාවලට අදාළව හිස්තැන් පුරවන්න.

| | හැඩය | පරිමාව | සම්පීඩනතාව |
|---|---|---|---|
| ඝන | (i) .................... | (ii) .................... | සම්පීඩනය කළ නොහැක. |
| ද්‍රව | නිශ්චිත හැඩයක් නැත. | (iii) .................... | (iv) .................... |
| වායු | (v) .................... | නිශ්චිත පරිමාවක් නැත. | (vi) .................... |

(ලකුණු 1/2 x 6= 3)

(C)




විද්‍යාගාරය තුළ සිදු කළ පරීක්ෂණයක ඇටවුමක් ඉහත රූප සටහනේ දැක්වේ.

(i) මෙම ක්‍රියාකාරකම සිදු කළේ ලෝහවල කුමන ගුණයක් පරීක්ෂා කිරීමට ද? (ලකුණු 1)

(ii) මෙහි දී අපේක්ෂිත නිරීක්ෂණය පළමුව දැකිය හැක්කේ කුමන ලෝහ වර්ගයක ද? (ලකුණු 2)

(මුළු ලකුණු 16)

(02) (A) පහත වගන්ති නිවැරදි නම් '✓' ලකුණ ද, වැරදි නම් 'X' ලකුණ ද යොදන්න.

(i) භෞතික රසායනික ක්‍රම මගින් තව දුරටත් වෙනස් ද්‍රව්‍යවලට බෙදිය නොහැකි සංශුද්ධ ද්‍රව්‍යය මූලද්‍රව්‍ය ලෙස හැඳින්වේ. ( )

(ii) සංවෘත පද්ධතියක් තුළ රසායනික ප්‍රතික්‍රියාවක දී සමස්ථ ස්කන්ධය වෙනස් විය හැකි ය. ( )


(iii) බන්සන් දැල්ලේ අදෘශ්‍ය කලාපය තුළ පූර්ණ දහනය සිදු වේ. ( )

(iv) හැඩය, පරිමාව, සම්පීඩනතාව, ඝනත්වය වැනි විශේෂ ගුණවලින් අංශුවල හැසිරීම පැහැදිලි කළ හැකි ය. ( )

(v) සන්නිවේදනය සඳහා භූ ස්ථායී චන්ද්‍රිකා භාවිත කළ හැකි ය. ( )

(ලකුණු 1 x 5= 5)

(B) විශේෂිත වූ විද්‍යුත් උපාංග ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීම සඳහා ඔබ විසින් විද්‍යාගාරය තුළ දී කරන ලද ක්‍රියාකාරකමට අදාළ පරිපථ සටහන් පහත රූපයේ දක්වේ.




(i) A හා B සංකේත වලින් දක්වා ඇති උපකරණ නම් කරන්න. (ලකුණු 2)

(ii) පරිපථය සම්පූර්ණ කිරීමෙන් පසු A උපාංගයට ආලෝකය නොලැබෙන පරිදි ආවරණය කළ අවස්ථාවේ දී බල්බය නොදැල්විණි. එහෙත් A මතට විදුලි පන්දම් ආලෝකය නිකුත් කළ විට බල්බය දැල්විණි. ඊට හේතුව A හි ක්‍රියාකාරීත්වය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iii) පහත සඳහන් P, Q, R උපකරණ ඒවායේ කාර්යක්ෂමතාව වැඩි වන පිළිවෙළට සකසන්න.


P - 240V, 60 W සූත්‍රිකා පහන

Q - 240V, 14 W සංගෘහිත ප්‍රදීපන පහන (CFL)

R - 240V, 7 W LED පහන (ලකුණු 1)

(iv) විද්‍යුත් උවාරණ භාවිතයේ දී සැලකිය යුතු කරුණු එකක් සඳහන් කරන්න. (ලකුණු 1)

(03) (A)




ඉහත දක්වෙනුයේ තඹ හා නික්‍රෝම් කම්බි තුළින් එකවර ධාරාව ගලායන අවස්ථාවකි.

(i) මෙම ක්‍රියාකාරකම මගින් ධාරාවේ කුමන ඵලය ආදර්ශනය කරයි ද? (ලකුණු 1)

(ii) පරිපථය සම්පූර්ණ කර ටික වේලාවකට පසු මෙම කම්බි දෙක අල්ලා බැලූ විට දැනෙන නිරීක්ෂණ සංසන්දනාත්මකව සඳහන් කරන්න. (ලකුණු 1)

(iii) විදුලි උපකරණයක් භාවිතයේ දී ඉහත සඳහන් කළ ධාරාවේ ඵලය අවාසිදායක වන අවස්ථාවක් උදාහරණය සහිතව දක්වන්න. (ලකුණු 2)

(iv) විදුලියෙන් රිජිෆෝම් කපන උපකරණයක් නිපදවීම සඳහා යොදා ගන්නා කම්බියක තිබිය යුතු ගුණාංග 2ක් ලියන්න. (ලකුණු 2)

(B) හිස්තැනට සුදුසු වචන යොදා පුරවන්න.

මිනිසාගේ මැදිහත් වීමකින් තොර ව ස්වාභාවිකව හට ගන්නා මිනිස් ජීවිතවලට, දේපළවලට පරිසරයට හා ආර්ථිකයට හානි කරන විනාශකාරී සිදුවීම් (i) ........................ ලෙස සැලකෙයි. ශ්‍රී ලංකාවට බලපෑ හැකි (ii) ........................ හා (iii) ........................ එවැනි අවස්ථා දෙකකි. පැසිපික් සාගරයේ මතුපිට ජලයේ (iv) ........................ ඉහළ යාම හේතුවෙන් (v) ........................ ක්‍රියාවලිය සිදුවේ. (ලකුණු 1 x 5)

(මුළු ලකුණු 11)

(04) (A) දී ඇති වචන අතුරින් හිස්තැන් පුරවන්න.

(i) චුම්බකයක් අවට චුම්බක බලය බල පැවැත්වෙන ප්‍රදේශය ........................ ලෙස හැඳින්වේ.


(ii) ස්ථිර චුම්බක සෑදීම සඳහා........................ ද, තාවකාලික චුම්බක සෑදීම සඳහා (iii) ........................ ද භාවිත කරයි.

(iii) නිවසෙහි ඇති ........................ විද්‍යුත් චුම්බකවල ප්‍රායෝගික භාවිත අවස්ථාවකි.

(iv) පෘථිවිය අසල පවතින චුම්බක ඵලය ........................ වේ. (ලකුණු 1 x4)

(ෆෙරයිට්, චුම්බක ක්ෂේත්‍රය, මෘදු යකඩ, භූ චුම්බකත්වය, විදුලි සීනුව)


(B) පහත දක්වා ඇත්තේ විද්‍යාගාරය තුළ දී ඔබ විසින්, කිසියම් පරිවහන ක්‍රියාවලියක් ආදර්ශනය සඳහා සකසන ලද ඇටවුමකි.




(i) විනාඩි කිහිපයකට පසු ඉහත ඇටවුමෙහි දක්නට ලැබෙන නිරීක්ෂණයක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) බීත්තර සිවිය මෙහි ක්‍රියාකරන්නේ කුමන පටලයක් ලෙස ද? (ලකුණු 1)


(iii) ඉහත ආකාරයට ද්‍රව්‍ය පරිවහනය වීම හඳුන්වන්නේ කුමන නමකින් ද? (ලකුණු 1)




(iv) ඉහත රූපයේ A හා B කොටස නම් කරන්න. (ලකුණු 2)

(v) ශාකයක ශක්තිය වැය කිරීම අවශ්‍ය වනුයේ මූල කේශයේ සිට C දක්වා ජලය ගමන් කිරීම සඳහා ද නැතහොත් ජලයේ දිය වූ ඛනිජ ලවණ සෛලවලට ඇතුළු වීම සඳහා ද? (ලකුණු 1)

(05) (A) මෑත කාලයේ දී ශ්‍රී ලංකාවේ බඩ ඉරිඟු වගාව ආශ්‍රිතව හානියක් සිදු කළ කෘමියාගේ ජීවන චක්‍රයේ අවස්ථා පහත දැක්වේ.





(i) ඉහත ජීවන චක්‍රයේ (2) හා (3) අවස්ථා නම් කරන්න. (ලකුණු 2)

(ii) ජීවන චක්‍රයේ අවස්ථා සලකා මෙය කුමන ආකාරයේ රූපාන්තරණයක් දැයි සඳහන් කරන්න. (ලකුණු 1)

(iii) බඩ ඉරිඟු වගාවට හානි කළ (2) අවස්ථාව හැඳින් වූ විශේෂ නම කුමක් ද? (ලකුණු 1)

(iv) පරිසර හිතකාමී ලෙස පළිබෝධයන් මර්දනය කිරීම සඳහා අතීතයේ දී ගොවීන් විසින් භාවිත කර ඇති සාම්ප්‍රදායික ක්‍රමයක් සඳහන් කරන්න. (ලකුණු 1)


(B) පෘථිවියේ පරිභ්‍රමණය අනුව ඍතු විපර්යාස ඇති වන ආකාරය පෙන්වන දළ සටහනක් පහත දැක්වේ.




(i) ඒ අනුව ජූනි 21 වන විට උෂ්ණ ඍතුව හා ශීත ඍතුව ඇති වන්නේ පෘථිවියේ කිනම් අර්ධ ගෝලවල දැයි වෙන වෙනම සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) පෘථිවි පරිභ්‍රමණයට අමතරව ඍතු විර්යාසය ඇති වීමට බලපාන අනෙක් ප්‍රධාන හේතුව කුමක් ද? (ලකුණු 1)

පහත දක්වා ඇත්තේ පෙබරවාරි, මාර්තු මාසවල දී රාත්‍රී 8.00ට පමණ අහසේ දැකිය හැකි තරු රටාවකි.



(iii) මෙම තරු රටාව හඳුන්වන නම කුමක් ද? (ලකුණු 1)

(iv) මෙම තරු රටාව ඇසුරින් පෘථිවියේ දිශා සොයා ගන්නා ආකාරය කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 1)

(v) රාත්‍රී අහසේ දක්නට ලැබෙන තරුවක් හා ග්‍රහලෝකයක් වෙන් කර හඳුනා ගත හැකි ආකාරයක් සංසන්දනාත්මකව සඳහන් කරන්න. (ලකුණු 1)


(06) (A)

(i) රූපයේ දැක්වෙන විදුලි පරිපථයේ බල්බ සම්බන්ධ කර ඇති ආකාරය කුමක් ද? (ලකුණු 1)

(ii) මෙම විදුලි පරිපථයේ කෝෂ සම්බන්ධ කර ඇති ආකාරය ලියන්න. (ලකුණු 1)


(iii) එම පරිපථය නියමිත පරිපථ සංකේත යොදා නැවත ඇඳ දක්වන්න. (ලකුණු 2)

(iv) ඉහත දැක්වෙන ආකාරයට බල්බ සම්බන්ධ කර ඇති ආකාරය අනුව ලැබෙන වාසියක් ලියන්න. (ලකුණු 1)



(v) මුළු ධාරාව ම බල්බ තුන තුළින් ගලා යන ආකාරයට බල්බ සම්බන්ධ කළ විට ඒවායේ දීප්තියට කුමක් සිදු වේද? (ලකුණු 1)

(B)



a b c d


(i) a, b, c, d සත්ත්වයින් අයත් වන කාණ්ඩ නම් කරන්න. (1/2 x 4 = ලකුණු 2)

(ii) ඉහත සත්ත්වයින් පෘෂ්ඨවංශීන් හා අපෘෂ්ඨවංශීන් ලෙස වෙන් කර ලියන්න. (1/2 x 4 = ලකුණු 2)

(ii) දේහය අරීය සමමිතික ස්වභාවයේ ඇති ජීවියා ඉහත ජීවීන් අතරින් කවරෙක් ද? (ලකුණු 1)

(මුළු ලකුණු 11)


(07) (A) වීදුරුවක රබර් බැලූනයක් යොදා සාදාගත් උපකරණයක් රූපයේ දක්වා ඇත.




(i) බැලුන් පටලය ඇදී ඇති ප්‍රමාණය වැඩි වන විට නිපදවෙන හඬ පිළිබඳව ඔබට කිව හැක්කේ කුමක් ද? (ලකුණු 1)

(ii) මෙහි දී වෙනස් වන ධ්වනි ලක්ෂණය හඳුන්වන නම කුමක් ද? (ලකුණු 1)

(iii) වයලීනයක කම්පනය වන කම්බියේ දිග අඩු කළ විට සහ වඩා සිහින් කම්බියක් කම්පනය කළ විට සංඛ්‍යාතයෙහි සිදු වන වෙනස වෙන වෙනම සඳහන් කරන්න. (ලකුණු 2)





මේසයකට කලම්ප කළ කියත් පටියක් පිහිටින අවස්ථා 2ක් රූපයේ දැක්වේ. A අවස්ථාවේ දී කම්පන දිග වැඩි අතර B අවස්ථාවේ දී කම්පන දිග අඩු ය.

(iv) A කියත් පටිය කම්පනය වුව ද හඬ නොඇසේ නම් ඊට හේතුව කුමක් ද? (ලකුණු 1)

(v) මිනිස් කනෙහි ශ්‍රවණ සීමාව සඳහන් කරන්න. (ලකුණු 1)

(B) මිනිස් සමෙහි ත්‍රිමාණ රේඛීය සටහනක් පහත රූපයේ දැක්වේ.





(i) ඉහත රූප සටහනෙහි අංක (1) කොටස නම් කර එහි පහළ ස්ථරයේ සෛලවලින් නිපදවෙන වර්ණකය සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) දේහ උෂ්ණත්වය පාලනය කිරීමට ඉවහල් වන ග්‍රන්ථියට අදාළ අංකය සඳහන් කර එහි නම ලියන්න. (ලකුණු 2)

(iii) නිරෝගී සමක් පවත්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න. (ලකුණු 1)

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) (A) වෙළඳපොළෙන් මිල දී ගත් ආහාර වර්ග කිහිපයක් පහත දක්වේ.




(i) මාළු සහ මිරිස් යන ද්‍රව්‍ය පරිරක්ෂණයට යොදා ගන්නා සම්ප්‍රදායික ක්‍රමය ලියන්න. (ලකුණු 1)

(ii) අඹ වැනි පළතුරක් යොදා ගෙන ඔබට විද්‍යාගාරයේ දී සකස් කළ හැකි නිෂ්පාදිතය කුමක් ද? (ලකුණු 1)

(iii) එහි දී යොදා ගත් පරිරක්ෂකය කුමක් ද? (ලකුණු 1)

(iv) ආහාර පරිරක්ෂණයේ ඇති වාසි 2ක් ලියන්න. (ලකුණු 2)

(v) ස්වයං වියෝජනය යනු කුමක් ද? (ලකුණු 1)

(vi) ආහාර ඇසුරුම් ලේබලයක අඩංගු විය යුතු වැදගත් කරුණු 4ක් ලියන්න. (ලකුණු 2)


(vii) පිරිසැකසුම් ආහාරයකට උදාහරණ 2ක් ලියන්න. (ලකුණු 2)

(B) පදාර්ථයේ භෞතික අවස්ථාවලට අදාළව හිස්තැන් පුරවන්න.

| | හැඩය | පරිමාව | සම්පීඩනතාව |
|---|---|---|---|
| ඝන | (i) ...................... | (ii) ...................... | සම්පීඩනය කළ නොහැක. |
| ද්‍රව | නිශ්චිත හැඩයක් නැත. | (iii) ...................... | (iv) ...................... |
| වායු | (v) ...................... | නිශ්චිත පරිමාවක් නැත. | (vi) ...................... |

(ලකුණු 1/2 x 6= 3)

(C)




විද්‍යාගාරය තුළ සිදු කළ පරීක්ෂණයක ඇටවුමක් ඉහත රූප සටහනේ දක්වේ.

(i) මෙම ක්‍රියාකාරකම සිදු කළේ ලෝහවල කුමන ගුණයක් පරීක්ෂා කිරීමට ද? (ලකුණු 1)

(ii) මෙහි දී අපේක්ෂිත නිරීක්ෂණය පළමුව දැකිය හැක්කේ කුමන ලෝහ වර්ගයක ද? (ලකුණු 2)

(මුළු ලකුණු 16)